# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 53 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1980 දෙසැම්බර් මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 1.10 යි.    තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1980 අංක 53 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1980 දෙසැම්බර් මස 11 වන දින]

එල්. ඩී.—ඕ. 10/80.

සිවිල් නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1980 අංක 53 දරන සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— 101 වන අධිකාරයේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"නඩු පිළිබඳ කාර්ය පටිපාටිය වැඩි වශයෙන් සාමාන්‍ය කාර්ය පටිපාටිය අනුව විය යුතු බව.

8. ලඝු කාර්ය පටිපාටිය අනුව නඩු කටයුතු ආරම්භ කරනු ලැබිය හැකි යයි මේ අඥපනතින් හෝ වෙනත් යම් නීතියකින් විශේෂයෙන් විධි විධාන සලසා ඇති නඩුවල දී හැර, සෑම නඩුවක් ම මෙහි මින් මතු නියම කරනු ලබන පරිදි සාමාන්‍ය කාර්ය පටිපාටිය අනුව ආරම්භ කොට පවත්වා ගෙන යා යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) එහි (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්; සහ

(ii) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(2අ) පැහැර හැරීම හේතුකොට ගෙන විත්තිකරුවකුට විරුද්ධව නඩු තීන්දුව වාර්තා ගත කිරීමට පෙර යම් වේලාවක, පැමිණිලිකරු කැමැත්ත දෙතොත්, විත්තිකරුගේ පැහැර හැරීමේ පදනම මත කරන ලද යම් ආඥාවක් අධිකරණය විසින් අවලංගු කොට ගාස්තු සම්බන්ධයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අධිකරණයට සුදුසු යයි පෙනී යන නියම මත ඒ පැහැර හැරීමේ අවස්ථාවේ සිට ස්වකීය විත්ති වාචකය පවත්වාගෙන යාමට විත්තිකරුට අවසර දිය හැකි ය. එහෙත් පැමිණිලිකරු කැමැත්ත නොදෙන්නේ නම් එසේ නොකළ හැකි ය.".

2—ඒ 51289—13,900 (80/10)

ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) පැහැර හැරීම සම්බන්ධයෙන් තීන්දු ප්‍රකාශයක් අවලංගු කිරීම ප්‍රතික්ෂේප කරමින් ආඥවක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ පැහැර හැරීම සම්බන්ධයෙන් වාර්තාගත කරන ලද තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යෙදවීමට සහ ඒ සම්බන්ධයෙන් 761 වන සහ 763 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 192 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 192 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) නඩුව පැමිණිලිකරුට ලැබිය යුතු මුදලක් සඳහා වූ විට, නඩුව පවරනු ලැබුවේ යම් සාධන පත්‍රයක් මත ද පාර්ශ්වකරුවන් එම සාධන පත්‍රයෙන් එකඟ වී ඇති අනුපාතිකයක් වෙතොත් ඒ අනුපාතිකය අනුව පොලිය හෝ එවැනි යම් එකඟ වීමක් නොමැති විට නඩුව පැවරීමට ප්‍රථම, යම් කාලයක් සඳහා මුල් මුදල වෙනුවෙන් තීන්දු කළ යම් පොලියකට අතිරේකව නඩුව පැවරූ දිනයේ සිට තීන්දු ප්‍රකාශය කළ දිනය දක්වා තීන්දු කරන ලද මුල් මුදල සඳහා සියයට දොළහක පොලියක් ද තීන්දු ප්‍රකාශයේ දිනයෙහි සිට මුදල ගෙවන දිනය දක්වා හෝ අධිකරණය සුදුසු යයි කල්පනා කරන ඊට කලින් වූ දිනයක් දක්වා හෝ කාලය වෙනුවෙන් එසේ තීන්දු කරන ලද සම්පූර්ණ මුදල සඳහා එවැනි ම සියයට ගණනක වැඩිදුර පොලියක් ද ගෙවන ලෙස අධිකරණය විසින් තීන්දු ප්‍රකාශයෙන් ආඥ කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 196 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 196 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

'නඩු දිනයේ සිට අතුරු ලාභ සම්බන්ධයෙන් හිමිකම් පෑමකට ඉඩදුන් විට තීන්දු ප්‍රකාශය.

196. නඩුව, බදු කුලියක් හෝ වෙනත් ලාභයක් ලැබෙන නිශ්චල දේපලක සන්තකය ආපසු ලබාගැනීම සඳහා වන අවස්ථාවක, පැමිණිල්ලේ ආයාචනයෙන් අතුරු ලාභ හෝ බදු කුලිය සම්බන්ධයෙන් අලාභ හෝ ඉල්ලා සිටින යාවර හෝ විටක, ඒ දේපළ සම්බන්ධයෙන්, නඩුව පැවරූ දින සිට, තීන්දු ප්‍රකාශය කරනු ලබන්නේ යම් පාර්ශ්වකරුවකුගේ වාසියට ද ඒ පාර්ශ්වකරුට සන්තකය භාර දෙනු ලබන තෙක් වූ අතුරු ලාභ හෝ බදු කුලිය වෙනුවට සුදුසු ය යි අධිකරණය විසින් කල්පනා කරනු ලබන පරිදි සියයට දොළහක් නොඉක්මවන අනුපාතිකයක් අනුව වූ පොලියක් සමග මුදල් ගෙවීමට අධිකරණය විසින් තීන්දු ප්‍රකාශයෙහි විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

පැහැදිලි කිරීම.—දේපළක "අතුරු ලාභ" යන්නෙන් ඒ දේපළ අයුතු සන්තකයට ගෙන සිටි තැනැත්තාට ඇත්ත වශයෙන් ලැබුණු හෝ සාමාන්‍ය උද්යෝගයෙන් ක්‍රියා කිරීමෙන් ඔහුට ලැබිය හැකිව තිබුණු ලාභ අදහස් වේ.'.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 213 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 213 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අධිකරණය විසින් නඩු ගාස්තුවලට පොලියක් නියම කළ හැකි බව.

213. ගාස්තු වෙනුවෙන් අවුරුද්දට සියයට දොළහක අනුපාතිකයක් නො ඉක්මවන යම් පොලියක් අධිකරණය විසින් නියම කළ හැකි අතර, ඒ ගස්තු පොළියත් සමග හෝ පොළිය නොමැතිව නඩුවෙහි විෂය වස්තුවෙන් ගෙවිය යුතු යයි හෝ නඩුවෙහි විෂය වස්තුවට වැය බරක් කළ යුතු යයි අධිකරණය විසින් විධාන කළ හැකි ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 222 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ: — ප්‍රධාන ප්‍රඥප්තියේ 222 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) (2) වන උපවගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි විනිශ්චිත ණයකරුට විරුද්ධව තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීම සඳහා වූ ඉල්ලීමක් ඒ ඉල්ලීමට විනිශ්චිත ණයකරු වගඋත්තර කරු කරනු ලැබිය යුතු වූ ද වැදගත් කරුණු දක්වෙන විනිශ්චිත ණයහිමියාගේ දිවුරුම් ප්‍රකාශයෙන් සනාථ කරන ලද පෙත්සමකින් කරනු ලැබිය යුතු ය. විභාග කිරීමෙන් පසු විනිශ්චිත ණයකරුට විරුද්ධව පෞද්ගලිකව ඒ තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යෙදවිය යුතු බවට අධිකරණය සෑහීමට පත්වන්නේ නම් ඒ ඉල්ලීම ප්‍රදානය කළ යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 325 වන වගන්තියේ (2) වන උපවගන්තිය වෙනුවට පහත දක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 325 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(2) විනිශ්චිත ණයහිමියා විසින් ඒකපාක්ෂික මෝසමකින් කරන ලද ඉල්ලීමක් මත (1) වන උපවගන්තිය යටතේ පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ විට, අවස්ථෝචිත පරිදි, විනිශ්චිත ණයකරු හෝ අනෙක් තැනැත්තා විසින් ඒ දේපළෙහි සන්තකය භාර දීමෙහි ලා පිස්කල්වරයාට ප්‍රතිරෝධය පාන ලද බව හෝ බාධා කරන ලද බව හෝ විනිශ්චිත ණයහිමියා විසින් සම්පූර්ණ හා බල සහිත සන්තකය අත්කර ගනු ලැබීමෙන් ඔහුට අවහිර කරන ලද බව හෝ පිටමං කරන ලද බව දනුම් දෙමින් සහ යම් අයිතිවාසිකමක් හෝ සම්බන්ධතාවක් ප්‍රකාර එකී සම්පූර්ණ දේපළෙහි හෝ එහි යම් කොටසක හෝ සන්තකයට හිමිකම් පාන්නාවූ ද විනිශ්චිත ණයහිමියාට සන්තකය භාර දීම ගැන විරෝධය පාන්නාවූ ද සියලුම තැනැත්තන් විසින්, දැන්වීම පළ කරනු ලැබූ දින සිට දින පහළොවක් ඇතුළත ස්වකීය හිමිකම්පෑම් අධිකරණ

යට නිවේදනය කළ යුතු යැයි ඔවුන්ට දනුම් දෙමින් දන්වීමක් පළ කරන ලෙස අධිකරණය විසින් පිස්කල්වරයාට විධාන කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 326 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 326 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත දක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) පෙත්සමේ කාරණය සහ හිමිකම් පෑමක් ඇත්නම් එය ද විභාග කිරීමේ දී—

(අ) පැමිණිලි කරන ලද ප්‍රතිරෝධය පෑම, බාධා කිරීම, අවහිර කිරීම හෝ පිටමං කිරීම විනිශ්චිත ණයකරු විසින් හෝ ඔහුගේ පෙළඹවීම පිට නැතහොත් ඔහු වෙනුවෙන් වෙනත් තැනැත්තකු විසින් හෝ සිදු කරන ලද බවට;

(ආ) පැමිණිලි කරන ලද ප්‍රතිරෝධය පෑම, බාධා කිරීම, අවහිර කිරීම, හෝ පිටමං කිරීම විනිශ්චිත ණයකරු නොවන වෙනත් තැනැත්තකු විසින් සිදු කරන ලද බවට සහ තමා වෙනුවෙන් වුවද විනිශ්චිත ණයකරු නොවන වෙනත් තැනැත්තකු වෙනුවෙන් වුවද දේපළ සන්තකයෙහි තබා ගැනීම සඳහා එවැනි තැනැත්තකුගේ හිමිකම් පෑම නිස්සාර හෝ පීඩාකාරී බවට; හෝ

(ඇ) ඉදිරිපත් කරන ලද හිමිකම් පෑමක් වෙතොත් එය ඔප්පුකර නොමැති බවට

අධිකරණය සෑහීමට පත් වුවහොත්, විනිශ්චිත ණය හිමියාට දේපළෙහි සන්තකය ලබා දෙන ලෙස හෝ ආපසු ලබා දෙන ලෙස හෝ අධිකරණය විසින් විධාන කළ යුතු ය. තව ද (අ) ඡේදයෙහි සඳහන් අවස්ථාවේ දී එම විධානයට අතිරේකව, අධිකරණය විසින් එකී විනිශ්චිත ණයකරු හෝ වෙනත් තැනැත්තා හෝ දින තිහක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට දණ්ඩන නියමයක් කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 330 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 330 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"තදනන්තර බාධා සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු ආකාරය.

330. (අ) විනිශ්චිත ණයකරු විසින් හෝ 325 වන වගන්තිය යටතේ පෙත්සමේ වෙනත් යම් වගඋත්තරකරුවකු විසින්, හෝ

(ආ) 325 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ දන්වීමක් යථා පරිදි පළකරනු ලැබූ අවස්ථාවක, කවරවූ තැනැත්තකු විසින්, හෝ

සන්තකය භාරදීමෙන් පසු එක් අවුරුද්දක් හා එක් දිනයක් ඇතුළත රිට් බලපත්‍රය ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් වූ යම් ප්‍රතිරෝධ පෑමක්

හෝ බාධා කිරීමක් හෝ විනිශ්චිත ණයහිමියාගේ සන්තකයට අවහිර කිරීමක් හෝ විනිශ්චිත ණය හිමියා පිටමං කිරීමක් හෝ අධිකරණයට අපහාස කිරීමක් වශයෙන් දඬුවම් කරනු ලැබිය යුතු ය.".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 337 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 337 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(i) එහි (1) වන උපවගන්තිය වෙනුවට, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) ඉන්ජන්ෂන් තහනමක් ප්‍රදානය කිරීමේ තීන්දු ප්‍රකාශයක් නොවන්නාවූ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාවේ යෙදවීම සඳහා කිසිම ඉල්ලීමක් (එය පළමු ඉල්ලීම හෝ තදනන්තර ඉල්ලීමක් වුවද)—

(අ) ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත තීන්දු ප්‍රකාශයේ දිනය හෝ ඒ තීන්දු ප්‍රකාශය ස්ථිර කරමින් අභියාචනයක දී කරන ලද යම් තීන්දු ප්‍රකාශයක් වේ නම් ඒ තීන්දු ප්‍රකාශයෙ දින සිට; හෝ

(ආ) නියමිත දිනයක හෝ පුනරුත් කාලසීමාවල දී මුදල් ගෙවීමට හෝ දේපළ භාර දීමට හෝ තීන්දු ප්‍රකාශයෙන් හෝ යම් තදනන්තර ආඥාවකින් විධාන කරනු ලැබූ අවස්ථාවක, ඉල්ලුම්කරු තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යෙදවීම අපේක්ෂා කළේ යම් ගෙවීමක් හෝ දේපළ භාරදීමක් සම්බන්ධව ද ඒ ගෙවීම හෝ දේපළ භාරදීම පැහැර හැරීමේ දින සිට

අවුරුදු දහයක් ඉකුත් වීමෙන් පසු ප්‍රදානය කරනු නොලැබිය යුතු ය."; තව ද

(ii) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(3) (2) වන උපවගන්තියේ ඇතුළත් විධිවිධානවලට යටත්ව, ක්‍රියාවේ යෙදවීමේ රිට් ආඥාවක් ක්‍රියාවේ යෙදවනු නොලැබුවේ නම්, එය නිකුත් කළ දින සිට එක් අවුරුද්දක් පමණක් සඳහා බලපැවැත්විය යුතු ය. එහෙත් රිට් ආඥාව ක්‍රියාවේ යොදවන තුරු—

(අ) රිට් ආඥාව ඉකුත්වීමට පෙර යම් අවස්ථාවක, අලුත් කිරීමේ දින සිට එක් අවුරුද්දකට ද එසේ කලින් කල ද විනිශ්චිත ණයහිමියා විසින් රිට් ආඥාව එසේ අලුත් කරනු ලැබිය හැකි ය; නැතහොත්

(ආ) කලින් නිකුත් කරන ලද රිට් ආඥාවක් ඉකුත් වීමෙන් පසු යම් අවස්ථාවක අලුත් රිට් ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 501 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 501 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"සිහිවිකල තැනැත්තන්හට සහ මානසික ඌනතාවක් ඇති තැනැත්තන්හට මේ පරිච්ඡේදය අදාළ විය යුතු බව.

501. (1) මේ ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ තත්කාලයෙහි බල පවත්නා යම් නීතියක් යටතේ හෝ සිහිවිකල තැනැත්තන් සහ මානසික ඌනතාවක් ඇති තැනැත්තන් ලෙස විනිශ්චය කරනු ලැබූ තැනැත්තන් සම්බන්ධයෙන් මේ පරිච්ඡේදයෙහි ඇතුළත් විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "සිහි විකල තැනැත්තන් සහ මානසික ඌනතාවක් ඇති තැනැත්තන්" යන්නෙන් මේ ආඥාපනතේ විධි විධාන යටතේ හෝ තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් යටතේ එසේ විනිශ්චය කරනු ලැබූ තැනැත්තන් හෝ එවැනි විනිශ්චය කිරීමක් ඇති නොවූ අවස්ථාවක සිහිවිකල්වූ හෝ මානසික ඌන තාවක් ඇත්තාවූ ද, තම කටයුතු කළමනාකරණය කිරීමට නොහැකි බවට, විභාග කිරීමෙන් පසු, අධි කරණය සෑහීමට පත් තැනැත්තන් අදහස් වේ.".

580අ. අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 580 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 580 අ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

"මානසික ඌනතාවක් ඇති තැනැත්තන්ට අදාළ විය යුතු විධිවිධාන.

580අ. (1) 555 වන වගන්තිය හැර, මේ පරිච්ඡේදයෙහි ඇතුළත් විධිවිධාන මානසික ඌනතාවක් ඇති තැනැත්තන් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා "මානසික ඌනතාවක් ඇති තැනැත්තන්" යන්නෙන් තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් අනුව සිහි විකල තැනැත්තන් වශයෙන් විනිශ්චය කරනු නො ලැබුව ද මානසික වශයෙන් රෝගිවීමේ, දුර්වලවීමේ, අබලතාවට පත්වීමේ හෝ දෝෂ සහිත වීමේ හේතුවෙන් ස්වකීය කටයුතු කළමනාකරණය කිරීමට නොහැකි තැනැත්තන් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 662 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 662 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ඉන්ජන්ෂන් තහනමක් ප්‍රදානය කළ හැකි අවස්ථාව.

662. යම් නඩුවක පැමිණිල්ලෙන් ඉන්ජන්ෂන් තහනමක් නිකුත් කරන ලෙස ආයාචනා කර ඇති අවස්ථාවක හැර, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 54 වැනි වගන්තියේ සඳහන් කාර්ය අතුරෙන් යම් කාර්යයක් සඳහා ඉන්ජන්ෂන් තහනමක් අරභයා කරනු ලබන සෑම ඉල්ලීමක් ම පෙත්සමක මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලීමට පදනම් කර ගනු ලැබූ සිද්ධි පිළිබඳ ප්‍රකාශයක් ද සමග ඉල්ලුම්කරුගේ හෝ එම සිද්ධි දන්නා වෙනත් තැනැත්තකුගේ හෝ දිවුරුම් පත්‍රයක් ඒ ඉල්ලීම සමග ඉදිරිපත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 745 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 745 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"සිහි විකල තැනැත්තන්, මානසික ඌනතාවක් ඇති තැනැත්තන් හා බාලවයස්කරුවන් පිළිබඳ අනිවාර්ය අධිකරණ බේරුම.

745. (අ) සිහිවිකල තැනැත්තකුගේ හෝ මානසික ඌනතාවක් ඇති තැනැත්තකුගේ බූදලයේ කළමනාකරුගේ ද;

(ආ) සිහිවිකල තැනැත්තකුගේ හෝ මානසික ඌනතාවක් ඇති තැනැත්තකුගේ පුද්ගල භාරකරුගේ ද;

(ඇ) බාලවයස්කරුවකුගේ දේපළ ආරක්ෂකගේ ද;

(ඈ) බාලවයස්කරුවකුගේ පුද්ගල භාරකරුගේ ද;

(ඉ) බාලවයස්කාර පැමිණිලිකරුවකුගේ සහාය මිත්‍රයාගේ ද;

(ඊ) බාලවයස්කාර විත්තිකරුවකුගේ නඩු වෙනි භාරකරුගේ ද

ගණන් හිලව්වල අධිකරණ බේරුමක් කරන ලෙස හා ඒ අධිකරණ බේරුමෙහි දී පැමිණ සිටීම සඳහා ඒ තැනැත්තන් කැඳවන ලෙස ඉල්ලා සිටින පෙත්සමක්, ගණන් හිලව් ඉදිරිපත් කිරීමට එයින් යම් තැනැත්තකුට නීතියෙන් නියමව ඇති සෑම අවස්ථාවක දී ම, මෙයට ඉහතින් අන්තිමට වූ පරිච්ඡේදයේ සඳහන් ආකාරයට, පහත දැක්වෙන තැනැත්

තත් අතුරෙන් යම් තැනැත්තකු විසින්, නිසි අධිකරණ බලය ඇති අධිකරණයට ඉදිරිපත් කළ හැකි ය:—

(අ) හා (ආ) ඡේද යටතේ ගැනෙන අවස්ථාවල දී—

සිහිවිකල තැනැත්තාගේ හෝ මානසික ඌනතාවක් ඇති තැනැත්තාගේ සිහිවිකලභාවය හෝ මානසික ඌනතාවය හෝ පහව ගොස් ඇති බව විනිශ්චයකින් පසු තීරණය කරනු ලැබූ විට, ඒ සිහිවිකලව සිටි තැනැත්තා හෝ මානසික ඌනතාව ඇතිව සිටි තැනැත්තා විසින් හෝ, සිහිවිකල තැනැත්තාගේ හෝ මානසික ඌනතාවක් ඇති තැනැත්තාගේ යම් ඥාතියකු හෝ මිත්‍රයකු විසින් හෝ මියගිය සිහිවිකල තැනැත්තකුගේ හෝ මානසික ඌනතාවක් ඇති තැනැත්තකුගේ පොල්මාකරු නැතහොත් අද්මිනිස්ත්‍රාසිකරු විසින් හෝ, (අ) ඡේදය යටතේ නම්, සිහිවිකල තැනැත්තාගේ හෝ මානසික ඌනතාව ඇති තැනැත්තාගේ පුද්ගල භාරකරු විසින් සහ, (ආ) ඡේදය යටතේ නම්, සිහිවිකල තැනැත්තාගේ හෝ මානසික ඌනතාව ඇති තැනැත්තාගේ බූදලයේ කළමනාකරු විසින් හෝ 556 වන වගන්තියේ සඳහන් යම් රජයේ නිලධරයකු විසින්;

(ඇ), (ඈ), (ඉ) සහ (ඊ) ඡේද යටතේ ගැනෙන අවස්ථාවල දී—

වයස් පිරීම සම්පූර්ණ වීමෙන් පසු බාලවයස්කරු විසින් හෝ මියගිය බාලවයස්කරුගේ පොල්මාකරු නැතහොත් අද්මිනිස්ත්‍රාසිකරු විසින් හෝ, (ඇ) ඡේදය යටතේ නම්, බාලවයස්කරුගේ පුද්ගල භාරකරු විසින් සහ (ඈ) ඡේදය යටතේ නම්, බාලවයස්කරුවකුගේ බූදලයේ දේපළ ආරක්ෂක විසින්;

තවද, ඕනෑම අවස්ථාවක දී, එවැනි යම් කළමනාකරුවකුගේ, දේපළ ආරක්ෂකයකුගේ, පුද්ගල ආරක්ෂකයකුගේ, සහාය මිත්‍රයකුගේ හෝ නඩුවෙහි භාරකරුවකුගේ අනුප්‍රාප්තිකයා විසින් ඉදිරිපත් කළ හැකි ය. එහෙත් (ඇ), (ඈ), (ඉ) හා (ඊ) ඡේද යටතේ ගැනෙන අවස්ථාවල දී, ගණන් ඉදිරිපත් කරනු ලැබීමට යටත් වන්නාවූ බාලවයස්කරුගේ මුදල් හෝ දේපළ, ගණන් ඉදිරිපත් කිරීමට නියමිත තැනැත්තාට ලැබුණු බවට හා ඔහු විසින් ඒ පිළිබඳව ගණන් දී නැති බවට සාක්ෂි අධිකරණය සෑහීමට පත්වන පරිදි ඉදිරිපත් කළ යුතු ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 749 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 749 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"සිහිවිකල නැනැත්තන්, මානසික ඌනතාවක් ඇති නැනැත්තන්, බාල වයස්කරුවන් හෝ භාරකරුවන් පිළිබඳ පෙත්සම්වල අවශ්‍යතා.

749. අවස්ථාවෝචිත පරිදි, සිහිවිකල නැනැත්තන්, මානසික ඌනතාවක් ඇති නැනැත්තන්, බාල වයස්කරුවන් හෝ භාරකරුවන් කෙරෙහි හෝ ඔවුන් සම්බන්ධයෙන් හෝ දිසා අධිකරණය සතු බලය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා පෙත්සමක් ඉදිරිපත් කරන සෑම අවස්ථාවක දී ම, ඒ පෙත්සමෙහි වගඋත්තරකරුවන් ලෙස නම් කරනු ලැබූ නැනැත්තන් හැර, පෙත්සමෙහි විෂය කාරණයට හෝ පෙත්සමෙන් ඉල්ලා සිටින ආඥාව බලපාන නැනැත්තකුට හෝ සම්බන්ධතාවක් ඇති වූ ද ඒ පෙත්සම සම්බන්ධයෙන් යම් විරෝධතාවය පෑමක් ඉදිරිපත් කළ හැකි වූ ද කිසිම නැනැත්තකු ගැන පෙත්සම්කරු නොදන්නා බව ඒ පෙත්සමෙහි ප්‍රකාශිතව ම සඳහන් විය යුතු ය.".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 752 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 752 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"කළමනාකරුවන්ගෙන් හා දේපළ ආරක්ෂකයන්ගෙන් ඇප.

752. සිහිවිකල නැනැත්තකුගේ හෝ මානසික ඌනතාවක් ඇති නැනැත්තකුගේ හෝ බූදලයේ කළමනාකරුවකු වශයෙන් පත් කරනු ලැබූ නැනැත්තාට හෝ බාලවයස්කරුවකුගේ බූදලයක දේපළ ආරක්ෂකයකු වශයෙන් පත් කරනු ලැබූ නැනැත්තාට හෝ බූදලයේ නිසි අද්මිනිස්ත්‍රාසිකරණය සඳහා ඇප තබන ලෙස නියම කිරීමේ දී, දිසා අධිකරණය විසින් මියගිය නැනැත්තන්ගේ බූදල්වල අද්මිනිස්ත්‍රාසිකරුවන්ට එවැනි ඇප තබන ලෙස නියම කිරීමට දිසා අධිකරණයට ඇති බලය, ඒ අයුරෙන් ම දිසා අධිකරණයට ඇත්තේ ය.".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 763 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 763 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ වගන්තිය එහි (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(ii) ඒ වගන්තියේ නැවත අංක කළ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2) (අ) තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යෙදවීම නතර කිරීමෙහි ලා ආඥාවක් කරනු ලැබුවේ නම් මිස, එහි ප්‍රතිඵලය වශයෙන් විනිශ්චිත ණය

කරුට සැලකිය යුතු පාඩු සිදු විය හැකි බව විනිශ්චිත ණයකරු විසින් අධිකරණය සෑහීමට පත් කරන අවස්ථාවක, සහ

(ආ) විනිශ්චිත ණයකරු අවසානාත්මක වශයෙන් බැඳෙන ඒ තීන්දු ප්‍රකාශය හෝ ආඥාව නිසි ලෙස ඉටු කිරීම සඳහා විනිශ්චිත ණයකරු විසින් ඇප දී ඇති අවස්ථාවක

සුදුසු යයි අධිකරණය විසින් සලකනු ලබන නියම සහ කොන්දේසි මත තීන්දු ප්‍රකාශය ක්‍රියාවේ යෙදවීම නතර කරනු ලැබීමට අධිකරණය විසින් ආඥා කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 800 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 800 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මේ පරිච්ඡේදය යටතේ නියම කළ යුතු දණ්ඩන නියම.

800. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 105(3) වන ව්‍යවස්ථාවේ සහ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 18 වන සහ 55 වන වගන්ති වල විධිවිධාන, අපහාස කිරීම සම්බන්ධයෙන් මේ පරිච්ඡේදය යටතේ වරදකරු කරනු ලැබූ විට, විවිධ අධිකරණ විසින්, අවස්ථෝචිත පරිදි, නියම කරනු ලබන දඩ ගැසීමේ හෝ බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩන නියමයට අදාළ විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපලේඛනය ආදේශ කරනු ලැබේ :—

214 වන වගන්තිය

## දෙවන උපලේඛනය

### I වන කොටස

### දිසා අධිකරණ

දිසා අධිකරණවල දී ලේඛනගත නීතිඥවරයන්ට ද පාර්ශ්වකරුවෙක් අනෙක් පාර්ශ්වකරුට ද සේවාදායකයා ලේඛනගත නීතිඥවරයාට ද ගෙවිය යුතු ගාස්තු හා දයකිරීම් ප්‍රමාණය

| නඩු නිමිත්තේ, ඉඩම් හෝ දේපළ සඳහා වූ හිමිකමේ, මුදලයේ හෝ නඩුවේ විෂය වස්තුවෙහි වටිනාකම | I වන පන්තිය රු. 1,500ට අඩු වූ විට | | II වන පන්තිය රු. 1,500ක් වූ විට සහ රු. 5000ට අඩු වූ විට | | III වන පන්තිය රු. 5,000ක් වූ විට සහ රු. 10,000ට අඩු වූ විට | | IV වන පන්තිය රු. 10,000ක් වූ විට සහ රු. 1,00,000ට අඩු වූ විට | |
|---|---|---|---|---|---|---|---|---|
| නඩු පැවරීමට, විත්ති වාචක ඉදිරිපත් කිරීමට, මැදිහත් වීමට හෝ අන්තර් උත්තරවාද ඉදිරිපත් කිරීමට, අද්මිනිස්ත්‍රාසි බල පත්‍රය, පුද්ගල ආරක්ෂකත්ව බලපත්‍රය හෝ ප්‍රොබෙට් බලපත්‍ර හෝ ප්‍රදානය කරවා ගැනීමට හෝ එවැන්නක ප්‍රදානයකට විරුද්ධවීමට හෝ මේ ආඥාපනත යටතේ විධිවිධාන සලසනු ලැබූ වෙනත් නඩු කටයුතු කිරීමට සේවාදායකයා සමග සාකච්ඡා කිරීම හා උපදෙස් ලබා ගැනීම ... ... | 25 | 00 | 35 | 00 | 50 | 00 | 65 | 00 |
| ඉහත සඳහන් යම් කාර්යයක් සඳහා ලේඛනගත නීතිඥවරයාට දෙනු ලබන පෙරකලාසිය ... ... | 10 | 00 | 15 | 00 | 20 | 00 | 25 | 00 |
| එත්තරවාසිය ... ... | 20 | 00 | 25 | 00 | 30 | 00 | 40 | 00 |
| නඩුවක් හෝ නඩු කටයුත්තක් පවතින අතරතුර සේවාදායකයා හමුවීමට අවශ්‍යව එසේ හමුවන එක් වරකට ... | 10 | 00 | 15 | 00 | 20 | 00 | 25 | 00 |
| නීතිඥවරයා හමුවීමට අවශ්‍යව එසේ හමුවන එක් වරකට ... | 10 | 00 | 15 | 00 | 20 | 00 | 25 | 00 |
| නඩුවක් හෝ නඩු කටයුත්තක් පවතින අතර විනිශ්චයකාරවරයා, රෙජිස්ට්‍රාර්වරයා, පිස්කල්වරයා, සමාදාන විනිශ්චයකාරවරයා, දිවුරුම් කොමසාරිස්වරයා, විරුද්ධ පාර්ශ්වකරු හෝ ඔහුගේ ලේඛනගත නීතිඥවරයා හෝ නීතිඥවරයා හෝ වෙනත් යම් තැනැත්තකු හමුවීමට අවශ්‍යව එසේ හමුවන එක් වරකට ... | 10 | 00 | 15 | 00 | 20 | 00 | 25 | 00 |
| නඩුවක් හෝ නඩු කටයුත්තක් පවතින අතර, ඉඩම් රෙජිස්ට්‍රාර් වරයා හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, මණ්ඩලයක හෝ වෙනත් යම් අධිකාරියක වෙනත් යම් නිලධරයකු හමු වීමට අවශ්‍යව, එසේ හමුවන එක් වරකට ... | 10 | 00 | 20 | 00 | 30 | 00 | 40 | 00 |
| පැමිණිල්ල, උත්තරය, ප්‍රතිඋත්තරය, කරුණු දක්වීම හෝ වෙනත් යම් උත්තරවාදයක්, පෙත්සමක් හෝ ඉල්ලීමක් සකස් කිරීම ... ... ... ... | 25 | 00 | 35 | 00 | 50 | 00 | 65 | 00 |
| ඉහත සඳහන් දේ පිළියෙළ කිරීමට හෝ සකස් කිරීමට නීතිඥ වරයාට ලියවිල්ලකින් උපදෙස් පිළියෙළ කිරීම හා ඒ සම්බන්ධයෙන් හමුවීම ... ... ... | 20 | 00 | 25 | 00 | 30 | 00 | 40 | 00 |
| අධිකරණයේ පෙනී සිටීම හා පැමිණිල්ල, උත්තරය, ප්‍රති උත්තරය, කරුණු දක්වීම හෝ වෙනත් යම් උත්තරවාදයක්, පෙත්සමක් හෝ ඉල්ලීමක් ඉදිරිපත් කිරීම ... ... | 10 | 00 | 15 | 00 | 20 | 00 | 25 | 00 |
| එහි පිටපතක් සෑදීම හා භාරදීම හෝ භාරදීම සඳහා එය පරිවර්තනය කිරීම පත් ඉරුවකට* ... ... ... | 1 | 00 | 1 | 50 | 1 | 50 | 2 | 00 |
| උත්තරවාදය සමග ඉදිරිපත් කරන හෝ පාර්ශ්වකරුවන්ට භාරදීම සඳහා ලේඛනවල පිටපත් සෑදීම. පත් ඉරුවකට* ... | 1 | 00 | 1 | 50 | 1 | 50 | 2 | 00 |
| සිතාසියක්, දැන්වීමක්, දණ්ඩනයක්, රිට් බලපත්‍රයක් හෝ වෙනත් අධිකරණ නියෝගයක්, අධිකරණ ආඥාවක්, තීන්දු ප්‍රකාශයක් හෝ නඩු තීන්දුවක් පිළියෙළ කිරීම ... ... | 3 | 00 | 4 | 00 | 6 | 00 | 10 | 00 |

*පත් ඉරුවක් වචන 120කින් සමන්විත විය යුතු ය.

| නඩු නිමිත්තේ, ඉඩම් හෝ දේපළ සඳහා වූ හිමිකමේ, මුදලයේ හෝ නඩුවේ විෂය වස්තුවෙහි වටිනාකම | I වන පන්තිය රු. 1,500 ට අඩු වූ විට | II වන පන්තිය රු. 1,500ක් වූ විට සහ රු. 5,000ට අඩු වූ විට | III වන පන්තිය රු. 5,000ක් වූ විට සහ රු. 10,000ට අඩු වූ විට | IV වන පන්තිය රු. 10,000ක් වූ විට සහ රු— 1,00,000ට අඩු වූ විට |
|---|---|---|---|---|
| එහි පිටපතක් සෑදීම හෝ පරිවර්තනය කිරීම ... ... | 1 50 | 2 00 | 3 00 | 4 00 |
| එය අත්සන් කරවා ගැනීම පිණිස රෙජිස්ට්‍රාර්වරයා හමුවීම ... | 10 00 | 15 00 | 20 00 | 25 00 |
| අවශ්‍ය වූ විට මෝසම් සහ වෙනත් සාමාන්‍ය ඉල්ලීම් සකස් කිරීම | 5 00 | 10 00 | 15 00 | 20 00 |
| අවශ්‍ය සියලු ඉල්ලීම් කිරීමට, සියලු මෝසම් ඉදිරිපත් කිරීමට, ඒ පිළිබඳ ආඥාවන් කියවා බැලීමට සහ සිතාසි හෝ දන්වීමක හෝ වෙනත් යම් කැඳවීම් නියෝගයක් ආපසු භාරදීම සඳහා සොද්දිසි කිරීමට අධිකරණ කාර්යාලවලට සහ ලේඛනාගාරවලට පැමිණීමට අවශ්‍ය එක් වරකට ... ... | 3 00 | 5 00 | 6 00 | 10 00 |
| ඉල්ලීමක් හෝ නඩු තීන්දුව සඳහා මෝසමක් හෝ වෙන යම් විශේෂ මෝසමක් හෝ ඉල්ලීමක් සනාථ කිරීමට හෝ ඊට විරුද්ධවීමට නීතිඥවරයකු නොමැතිව අධිකරණයේ පෙනී සිටීමට ... ... ... ... | 25 00 | 35 00 | 50 00 | 65 00 |
| සියලු අවශ්‍ය හෝ සාමාන්‍ය ඉල්ලීම් හෝ මෝසම් සනාථ කිරීමට හෝ ඊට විරුද්ධවීමට අධිකරණයේ පෙනී සිටීම ... | 25 00 | 35 00 | 50 00 | 65 00 |
| දිවුරුම් පත්‍රයක් සකස් කිරීම හා එහි ශුද්ධ පිටපත පිළියෙළ කිරීම | 15 00 | 20 00 | 30 00 | 65 00 |
| තීන්දු ප්‍රකාශ, තීන්දුව ක්‍රියාවෙහි යෙදවීම සඳහා වූ ඉල්ලීම්, ප්‍රොබේට් බලපත්‍රය, ඇඩ්මිනිස්ත්‍රාසි බලපත්‍රය, විචාරණය, හරස් විචාරණය, අධිකාර පත්‍ර, විශේෂ නඩු, ඉන්ජන්ෂන් තහනම්, තහනමට ගැනීම්, ප්‍රකාශන බැඳුම්කර, යොමු කිරීම්, කැඳවීම් නියෝග, දේපළ ලැයිස්තු සහ ගිණුම් පිළියෙළ කිරීම ... | 15 00 | 25 00 | 40 00 | 50 00 |
| නීතිඥවරයා සඳහා නඩු කොපිය හා එහි ශුද්ධ පිටපත පිළියෙළ කිරීම, පත් ඉරුවකට* ... ... | 1 00 | 1 50 | 1 50 | 2 00 |
| නඩු කොපිය සමග යැවීමට උත්තරවාදවල හා ලේඛනවල පිටපත් සෑදීම, පත් ඉරුවකට* ... ... | 1 00 | 1 50 | 1 50 | 2 00 |
| නීතිඥවරයන් දෙදෙනකු හෝ වැඩි දෙනකු යෙදූ වූ අවස්ථාවක දෙවන නඩු කොපිය පිළියෙළ කිරීම, පත් ඉරුවකට* ... (වැඩිපුර නඩු කොපි සඳහා ගාස්තු නැත) | 1 00 | 1 50 | 1 50 | 2 00 |
| නඩුව තර්ක කරනු ලැබුවේ නම් නැතහොත් විභාග කරනු ලැබුවේ නම්, නඩු විභාගය සම්බන්ධයෙන් නීතිඥවරයා සමඟ අධිකරණයේ පෙනී සිටීම ... ... | 50 00 | 70 00 | 100 00 | 125 00 |
| නඩුව අඩාළව කල් තබන ලද හෝ කල් දමන ලද හෝ අත්හරින ලද නම් නඩු විභාගය සම්බන්ධයෙන් නීතිඥවරයා සමඟ අධිකරණයේ පෙනී සිටීම ... ... | 30 00 | 50 00 | 80 00 | 100 00 |
| නීතිඥවරයකු නොමැතිව, නඩු විභාගය සම්බන්ධයෙන් අධිකරණයේ පෙනී සිට, නඩුව පවත්වා ගෙන යාම ... | 50 00 | 100 00 | 150 00 | 190 00 |
| නඩුව අඩාළව කල් තබන ලද හෝ කල් දමන ලද හෝ අත්හරින ලද නම්, නඩු විභාගය සම්බන්ධයෙන් නීතිඥවරයකු නොමැතිව අධිකරණයේ පෙනී සිටීම ... ... | 30 00 | 50 00 | 80 00 | 100 00 |
| නඩු තීන්දුව කල් තැබූ අවස්ථාවක එය ඇසීමට අධිකරණයේ පෙනී සිටීම ... ... ... | 25 00 | 35 00 | 50 00 | 65 00 |
| නීතිඥවරයා නොමැතිව බේරුම් කිරීමකට පෙනී සිටීම, එක් එක් හමුවීමක් සඳහා (සය වන රැස්වීමෙන් පසු ගාස්තු නැත) ... | 50 00 | 100 00 | 150 00 | 190 00 |
| නීතිඥවරයා සමඟ බේරුම් කිරීමකට පෙනී සිටීම, එක් එක් හමුවීමක් සඳහා (සය වන රැස්වීමෙන් පසු ගාස්තු නැත) ... | 30 00 | 50 00 | 80 00 | 100 00 |

*පත් ඉරුවක් වචන 120කින් සමන්විත විය යුතු ය.

| නඩු නිමිත්තේ, ඉඩම් හෝ දේපළ සඳහා වූ හිමිකමේ, මුදලයේ හෝ නඩුවේ විෂය වස්තුවෙහි වටිනාකම | I වන පන්තිය රු. 1,500 ට අඩු වූ විට | II වන පන්තිය රු. 1,500ක් වූ විට සහ රු. 5,000ට අඩුවූ විට | III වන පන්තිය රු. 5,000ක් වූ විට සහ රු. 10,000ට අඩු වූ විට | IV වන පන්තිය රු. 10,000ක් වූ විට සහ රු. 1,00,000ට අඩු වූ විට |
|---|---|---|---|---|
| ස්ථානීක ගිනුම් පරීක්ෂණය සම්බන්ධයෙන් සාක්ෂිකරුවන්ගෙන් ප්‍රශ්න ඇසීමට හෝ හරස් ප්‍රශ්න ඇසීමට හෝ වෙන යම් කාර්යයක් සඳහා නීතිඥවරයකු සමඟ අධිකාර පත්‍ර ලාභියා හමුවීම ... ... ... | 20 00 | 30 00 | 50 00 | 65 00 |
| නීතිඥවරයකු නොමැතිව ඉහත සඳහන් පරිදි අධිකාර පත්‍ර ලාභියා හමුවීම ... ... ... | 40 00 | 50 00 | 70 00 | 90 00 |
| නඩු ගාස්තු බිල් බලපත්‍රය සකස් කිරීම සහ එහි ශුද්ධ පිටපතක් පිළියෙළ කිරීම. ... ... ... | 1 50 | 30 00 | 50 00 | 50 00 |
| | පත් ඉරුවකට* | පත්ඉරු ගණන නොතකා | පත්ඉරු ගණන නොතකා | පත්ඉරු ගණන නොතකා |
| ගාස්තු තක්සේරු කිරීමෙහි දී පෙනී සිටීම ... ... | 10 00 | 20 00 | 30 00 | 40 00 |
| විරුද්ධ පාර්ශ්වය විසින් කිසියම් නඩුවක් හෝ නඩු කටයුත්තක් සඳහා සපයන ලද හෝ පාවිච්චි කරන ලද හෝ එවැනි යම් නඩුවක හෝ නඩු කටයුත්තක සාක්ෂි වශයෙන් ප්‍රයෝජනයට ගැනීමේ කාර්යය සඳහා යම් පාර්ශ්වයක් විසින් තම ලේඛනගත නීතිඥවරයාට සපයන ලද ලියවිලි, ප්‍රදර්ශන හෝ ලේඛන කියවා බැලීම හා සලකා බැලීම සඳහා | මේ ආඥාපනතෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි සමාලෝචනය කිරීමට හා අභියාචනා කිරීමට යටත්ව රෙජිස්ට්‍රාර්වරයා විසින් සාධාරණ හා යුක්ති සහගත යයි සලකන මුදල් ප්‍රමාණයක් | | | |
| නඩු විභාගයට සූදානම් වීම හෝ නඩු කොපිය සඳහා උපදෙස් සැපයීමට සාක්ෂිකරුවන් විමසීම (එක් සාක්ෂිකරුවකුට) ... | 10 00 | 20 00 | 30 00 | 40 00 |
| තැපැල් ගාස්තු හැර, ලියුම් පොතෙන් සහතික කරන ලද සෑම අවශ්‍ය ලිපියක් සඳහා ... ... ... | 5 00 | 10 00 | 15 00 | 20 00 |

සිතියම් ,මැනුම්, පිඹුරු හෝ අනුරූප අවශ්‍ය වූ විට සමාලෝචනය කිරීමට හා අභියාචනා කිරීමට යටත්ව, රෙජිස්ට්‍රාර් වරයා විසින් යුක්තිසහගත යයි සලකනු ලබන මුදල් ප්‍රමාණයක්.

අධිකරණය විසින් තීරණය කරනු ලබන පරිදි සාක්ෂි කරුවන්ගේ වියදම්.

සියලු අවශ්‍ය උපදෙස්, ඉල්ලීම සහ මෝසම් ද උපදෙස් සාකච්ඡා සම්බන්ධයෙන් සියලු අවශ්‍ය පෙනී සිටීම් ද ලේඛන පිටපත් හා අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු නොලැබූ (ලිපි ඇතුළුව) සියලු ගාස්තු හා අයකිරීම් ද සම්බන්ධයෙන් සමාලෝචනය කිරීමට හා අභියාචනා කිරීමට යටත්ව රෙජිස්ට්‍රාර්වරයා විසින් යුක්තිසහගත යයි සලකනු ලබන මුදල් ප්‍රමාණයක්.

රු. 1,00,000ක් සහ ඊට ඉහළ මුදලක් සම්බන්ධයෙන් සියලු නඩුවල දී IV වන පන්තියට වඩා තුනෙන් එකකින් (1/3) ගාස්තු වැඩි විය යුතු ය.

* පත් ඉරුවක් වචන 120කින් සමන්විත විය යුතු ය.

## II වන කොටස

### දිසා අධිකරණවල නීතිඥවරයන්ට ගෙවිය යුතු ගාස්තු ප්‍රමාණය

| නඩු නිමිත්තේ, ඉඩම සහ දේපළ සඳහා වූ හිමිකමේ, මුදලයේ හෝ නඩුවේ විෂය වස්තුවෙහි වටිනාකම | I වන පන්තිය රු. 1,500ට අඩු වූ විට | II වන පන්තිය රු. 1,500ක් වූ විට සහ රු. 5,000ට අඩු වූ විට | III වන පන්තිය රු. 5,000ක් වූ විට සහ රු. 10,000ට අඩු වූ විට | IV වන පන්තිය රු. 10,000 ක් සහ ඊට වැඩි වූ විට |
|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ |
| මූලික ගාස්තු ... ... ... | 30 00 | 50 00 | 70 00 | 100 00 |
| නඩුව, චිත්ති වාචක ඉදිරිපත් කිරීම හෝ අභියාචනය කිරීම සම්බන්ධයෙන් උපදෙස් දීම ... ... | 30 00 | 50 00 | 70 00 | 100 00 |

| නඩු නිමිත්තේ, ඉඩම් හෝ දේපළ සඳහා වූ හිමිකමේ, මුදලයේ හෝ නඩුවේ විෂය වස්තුවෙහි වටිනාකම | I වන පන්තිය රු. 1,500ට අඩු වූ විට | | II වන පන්තිය රු. 1,500ක් වූ විට සහ රු 5,000ට අඩු වූ විට | | III වන පන්තිය රු. 5,000ක් වූ විට සහ රු. 10,000ට අඩු වූ විට | | IV වන පන්තිය රු. 10,000ක් සහ ඊට වැඩි වූ විට | |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| යම් උත්තරවාදයක්, ඉල්ලීමක් හෝ පෙත්සමක් සෑදීම, කියවා බැලීම, සකස් කිරීම හා අත්සන් කිරීම ... ... | 50 | 00 | 70 | 00 | 100 | 00 | 200.00 සිට 300.00 දක්වා | |
| විශේෂ නඩුවක් සෑදීම, කියවා බැලීම හා සකස් කිරීම ... | 50 | 00 | 70 | 00 | 100 | 00 | 200 | 00 |
| විචාරණයක්, තීන්දු ප්‍රකාශයක් ආදිය සෑදීම, කියවා බැලීම හා සකස් කිරීම ... ... ... | 50 | 00 | 70 | 00 | 100 | 00 | 150 | 00 |
| උපදෙස් සාකච්ඡා ගාස්තු ... ... ... | 50 | 00 | 70 | 00 | 100 | 00 | 200 | 00 |
| යම් විශේෂ මෝසමක් හෝ ඉල්ලීමක් සනාථ කිරීම හෝ ඊට විරුද්ධ වීම ... ... | 50 | 00 | 70 | 00 | 100 | 00 | 200 | 00 |
| නඩු විභාගයේ දී හෝ තර්ක කිරීමේ දී නඩු කොපි ගාස්තු ... | 100 | 00 | 150 | 00 | 200 | 00 | 300.00 සිට 1000.00 දක්වා | |
| නඩු විභාගය හෝ තර්ක කිරීම නැවත ආරම්භ කළ අවස්ථාවක නඩු කොපි ගාස්තු ... ... ... | 50 | 00 | 100 | 00 | 150 | 00 | 200.00 සිට 700.00 දක්වා | |

සැ.යු.—(1) I වන හා II වන පන්ති සම්බන්ධයෙන් නීතිඥවරයන් දෙදෙනකු යොදන ලද අවස්ථාවක කණිෂ්ඨ නීතිඥවරයකුගේ ගාස්තුව සඳහා ඉඩ දෙනු නොලැබේ.

(2) කිසිම පන්තියක දී තුන්වන නීතිඥවරයකුගේ ගාස්තුව සඳහා ඉඩ දෙනු නොලැබේ.

(3) නීතිඥවරයන් දෙදෙනකු යොදන ලද අවස්ථාවක කණිෂ්ඨ නීතිඥවරයකුගේ නඩු කොපි ගාස්තුව, ජ්‍යෙෂ්ඨ නීතිඥවරයාගේ නඩු කොපි ගාස්තුවෙන් අර්ධයක් විය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයා වෙත විශේෂ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු මේ ආඥාපනතින් විධිවිධාන සලස්වා ඇති පරිදි, සමාලෝචනය කිරීමට හා අභියාචනා කිරීමට යටත්ව (අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු නොලැබූ) යුක්තිසහගත යයි රෙජිස්ට්‍රාර්වරයා විසින් සලකනු ලබන යම් අයකිරීමකට හෝ ගාස්තුවකට ඔහු විසින් ඉඩ දිය හැකි ය.

## III වන කොටස

### අභියාචනාධිකරණය

### අභියාචනවල දී නීතිඥවරයන්ගේ ගාස්තු

නඩුවේ වටිනාකම රු. 1,500ක් හෝ ඊට අඩු අභියාචනා :

තර්ක කිරීම සඳහා නඩු කොපි ගාස්තු ... ... රු. 100.00

නඩුවේ වටිනාකම රු. 1,500 ට වැඩි අභියාචනා :

මූලික ගාස්තුව ... ... ... රු. 100.00

උපදෙස් සාකච්ඡා ගාස්තු ... ... ... රු. 100.00 සිට රු. 300.00 දක්වා

යම් විශේෂ මෝසමක් සෑදීම හෝ එයට විරුද්ධ වීම ... රු. 100.00 සිට රු. 300.00 දක්වා

නඩු කොපි ගාස්තු ... ... ... රු. 200.00 සිට රු. 2,000.00 දක්වා

යම් ඉල්ලීමක් හෝ පෙත්සමක් පිළියෙළ කිරීම, කියවා බැලීම, සකස් කිරීම හා අත්සන් කිරීම ... ... ... රු. 100.00 සිට රු. 300.00 දක්වා

පාර්ශ්වකරුවකු විසින් පාර්ශ්වකරුවකුට ද සේවාදායකයකු විසින් ලේඛනගත නීතිඥවරයාට ද ගෙවිය යුතු ලේඛනගත නීතිඥවරයාගේ ගාස්තු

| | I වන පන්තිය රු. 1,500ක් සහ ඊට අඩු වූ විට | | II වන පන්තිය රු. 5,000ක් සහ ඊට අඩු වූ විට | | III වන පන්තිය රු. 10,000ක් සහ ඊට අඩු වූ විට | | IV වන පන්තිය රු. 1,00,000ක් සහ ඊටඅඩු වූ විට | |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| පෙරකලාසිය ... ... ... | 7 | 50 | 10 | 00 | 15 | 00 | 20 | 00 |
| යම් විශේෂ මෝසමක් ඉදිරිපත් කිරීමට හෝ එයට විරුද්ධ වීමට නීතිඥවරයාට උපදෙස් දීම හෝ අභියාචකගේ හෝ වගඋත්තරකරුගේ නඩුව සම්බන්ධයෙන් උපදෙස් දීම ... | 50 | 00 | 75 | 00 | 100 | 00 | 125 | 00 |
| නීතිඥවරයා සඳහා නඩු කොපිය හෝ යම් බැඳුම්කරයක්, දිවුරුම් පත්‍රයක් හෝ පෙත්සමක් හෝ ඉල්ලීමක් හා එම ශුද්ධ පිටපත පිළියෙල කිරීම. පත් ඉරුවකට* ... ... | 2 | 50 | 5 | 00 | 5 | 00 | 7 | 00 |
| නඩු කොපියක් සමඟ යැවීම සඳහා උත්තරවාදවල, සාක්ෂිවල සහ ලේඛනවල ආසන්න පිටපත්. පත් ඉරුවකට* ... | 1 | 25 | 1 | 25 | 1 | 25 | 1 | 50 |
| අධිකරණයේ දී පෙනී සිටීම ... ... ... | 50 | 00 | 75 | 00 | 100 | 00 | 125 | 00 |
| රෙජිස්ට්‍රාර්වරයා හමුවීමට අවශ්‍ය සෑම අවස්ථාවක දී ම එසේ හමුවීමට ... ... ... | 25 | 00 | 25 | 00 | 25 | 00 | 35 | 00 |
| ගාස්තු බිල් පත්‍රය සකස් කිරීම ... ... | 22 | 50 | 22 | 50 | 22 | 50 | 30 | 00 |
| ගාස්තු තක්සේරු කිරීමේ දන්වීම සමග පිටපතක් භාරදීම. ... | 7 | 50 | 7 | 50 | 7 | 50 | 10 | 00 |

* පත් ඉරුවක් වචන 120කින් සමන්විත විය යුතු ය.

1 වන සටහන : රුපියල් 1,00,000 ට ඉහළ මුදලක් සම්බන්ධයෙන් සියලු නඩුවල දී IV වන පන්තියට වඩා තුනෙන් එකකින් (1/3) ගාස්තු වැඩි විය යුතු ය.

2 වන සටහන : විශේෂ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු, අධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීමට යටත්ව මෙහි විශේෂයෙන් විධිවිධාන සලස්වනු නොලැබූ යම් ගාස්තු හෝ අය කිරීම් සඳහා රෙජිස්ට්‍රාර්වරයා විසින් යුක්තිසහගත යයි සලකනු ලබන පරිදි ඔහු විසින් ඉඩ දිය හැකිය.